# නිවේදනය යි!

**1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නම් කරන ලද සියළුම බලයලත් නිලධාරිවරුන් සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් වෙත:**

මොනොක්‍රොටපොස් යනු ලෝක සෞඛ්‍ය සංවිධානයේ පළිබෝධනාශක සංයෝජන අනතුරුදායක වර්ගීකරණය (WHO Hazard Classification) අනුව උග්‍ර විෂවීමේ සම්භාවිතාවයක් සහිත කෘමිනාශකය කි. මෙම කෘමිනාශකය එක්සත් ජාතීන්ගේ රොටර්ඩෑම් සම්මුතිය යටතේ ද ලැයිස්තුගත උග්‍ර අවදානම් කෘමිනාශකය කි. පොල් පර්යේෂණ ආයතනයේ නිර්දේශය මත සහ පොල් වගාකිරීමේ මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ පොල් රතු කුරුමිණියාගේ (Red Palm Weevil) හානිය පාලනය කිරීම සඳහා ඉතා සීමිත සහ වාර්ෂිකව අවශ්‍ය මොනොක්‍රොටපොස් 60% එස්.එල්. සංයෝජන ප්‍රමාණය ආනයනය සිදුකර ඇසිරීම සහ සැපයීම සී.අයි.සී. හෝල්ඩිංග්ස් පී.එල්.සී. ආයතනය විසින් පමණක් සිදුකරන අතර, ඒ සඳහා විධිමත් පරිහරණ යාන්ත්‍රණයක් සකස් කර ක්‍රියාත්මක කරමින් ඇත.

මේ අනුව, මොනොක්‍රොටපොස් 60% එස්.එල්. කෘමිනාශකය කිසිදු ආකාරයකින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය මත සිදු කෙරෙන පොල් වගාවේ උක්ත නිර්දේශිත භාවිතාවන් සඳහා හැර වෙනත් කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කිරීමට හෝ තොග හෝ සිල්ලර අලෙවිසැල්වල අලෙවි කිරීමට හෝ අවස්ථාවක් නොමැත. නීත්‍යානුකූලව ලියාපදිංචි කරන ලද මොනොක්‍රොටපොස් 60% එස්.එල්. නිෂ්පාදනය "මොනොක්‍රොටපොස් 60 එස්.එල්." (ලියාපදිංචි අංකය M500100) යන වෙළෙඳනාමය යටතේ පමණක් හඳුණාගත හැකි ය.

මේ අතර, වෙළෙඳපොලේ හමුවිය හැකි 36% ක් මොනොක්‍රොටපොස් අඩංගු LUPHOS 36 (monocrotophos 36% SL) හා ANUCRON (monocrotophos 36% SL) යන වෙළෙඳනම්වලින් සමන්විත කුඩා ඇසුරුම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ කිසිදු නීත්‍යාණුකූල වලංගු භාවයක් නොමැති බව මෙයින් අවධාරණය කරමි. පළිබෝධනාශක අලෙවි ක්ෂේත්‍රයේ සමහර පුද්ගල කණ්ඩායම් විසින් නීති විරෝධී මොනොක්‍රොටපොස් සංයෝජන ඉන්දියාවෙන් රැගෙනවිත් බෙදා හැරීම හා අලෙවි කිරීම වැනි වංචනික ක්‍රියා සිදුකරමින් පවතින බව මූලික පරීක්ෂණවල දී අනාවරණය කර ගෙන ඇත. බිබිල, ඇඹිලිපිටිය, ඇතිලිවැව, හම්බන්තොට, අනුරාධපුර, මැදවච්චිය වැනි ප්‍රදේශවලින් හමු වී ඇති මේ සමඟ දැක්වෙන LUPHOS 36 හා ANUCRON යන වෙළෙඳනාමයන් සහිත නිෂ්පාදන සම්බන්ධයෙන් නිරන්තර අවධානයෙන් සහ සුපරීක්ෂාකාරීව කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

දිවයිනේ සමහර පළිබෝධනාශක අලෙවිසැල් සම්බන්ධ කර ගනිමින් සිදු කරන මෙම නීති විරෝධී අලෙවි ක්‍රියාකාරකම් පිළිබඳව උක්ත පනත යටතේ දිවයින පුරා සිටින නම් කරන ලද බලයලත් නිලධාරිවරුන් සහ සියළුම නඩු පැවරීමේ හා නඩු කටයුතු මෙහෙයවීමේ බලයලත් නිලධාරිවරුන් වශයෙන් එක් එක්

නිලධාරීන් සතු පරිපාලන බල ප්‍රදේශ ආවරණය වන පරිදි දිවයින පුරා අවශ්‍ය විමර්ෂණ සිදුකර සියළුම නීති විරෝධී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වර්ෂ 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ පැවරී ඇති විධි විධාන පරිදි විධිමත් විමර්ශන පවත්වා නීත්‍යානුකූල පියවර ගන්නා මෙන් මෙයින් දැනුම් දෙමි.




අනුමත කරන ලද පළිබෝධනාශක සංයෝජන පිලිබඳ තොරතුරු අඩංගු ලැයිස්තුව [www.doa.gov.lk](http://www.doa.gov.lk) දරන වෙබ් අඩවියට ප්‍රවේශවීමෙන් හෝ 2018.09.13 දින අංක 2088/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය, [www.documents.gov.lk](http://www.documents.gov.lk) මගින් හෝ පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කර ඇති වලංගු බලපත්‍ර පරීක්ෂා කිරීම මගින් හෝ දැනගත හැකි ය.




මේ පිලිබඳ අවශ්‍ය ඕනෑම තොරතුරක් සඳහා සහ ඉහත සඳහන් අවශ්‍යතා උල්ලංඝනය වන අවස්ථා වෙතොත්, ඒ පිළිබඳ තොරතුරු දැන්වීම සඳහා සහ අවශ්‍ය නීති සම්බන්ධීකරණ සේවා සඳහා පහත දැක්වෙන දූරකථන හා ෆැක්ස් අංක ඔස්සේ මෙම කාර්යාලය අමතන මෙන් ඉල්ලා සිටිමි.

ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2020 පෙබරවාරි මස 26 වන දින,
පේරාදෙණිය.

Tel./Fax.) 081 2388135 or (Tel.) 081 2388076 (Mobile) 077 2363824